දිනමිණ සිළුමිණ epaper

# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
# සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සහකාර සාමාන්‍යාධිකාරී (නීති) තනතුර සඳහා පුරප්පාඩු පිරවීම

## සහකාර සාමාන්‍යාධිකාරී (නීති)
## MM 1-1 "කළමනාකාර" සේවා ගණය - තනතුරු 01 කි

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී උපාධියක් ලබා තිබීම සමග ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව වසර තුනකට (03) නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

**වැටුප:** MM 1-1 - රු.53,175 - 10x1,375 - 15x1,910 = 95,575

- රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- දුරකථන බිල්පත් සීමාවකට යටත්ව ප්‍රතිපූර්ණ කරනු ලැබේ.

**වයස :** අවුරුදු 35ට නො අඩු සහ අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

**සෑම අයදුම්කරුවෙකුම,**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**තනතුරට අදාළ පොදු කොන්දේසි**

- මෙම තනතුර ස්ථිර වන අතර, විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 15% ක්ද, සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.
- රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු වේ.
- අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළයුතුය.
- අධ්‍යාපන, වෙනත් සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.
- අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.

**අයදුම් කළ යුතු ආකාරය**

මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුළත් ජීව දත්ත සටහන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරෙහි **සහකාර සාමාන්‍යාධිකාරී (නීති) තනතුරට බඳවා ගැනීම** යනුවෙන් සඳහන් කොට පහත සඳහන් ලිපිනයට 2024.02.09 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ hr@cma.lk දරන email (විද්‍යුත් තැපැල) ලිපිනයට එවිය යුතුය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය,**
**1 වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,**
**කොළඹ - 2.**